WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

44 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

## නැටුම් (දේශීය) II

※ **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** සියලු ම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ **අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

(i) ප්‍රථමයෙන් උඩරට වන්නම් ගායනා කරන ලද්දේ ................................ මඩුවේ දී ය.

(ii) 'කෝලාට්ටම්' දමිළ ගැමි නර්තනය, දේශීය ගැමි නැටුම්වල ................................ නර්තනයට සමාන වේ.

(iii) 'මිනික්කු' සහ 'පච්චා' යනු ................................ නර්තනයේ වේශ නිරූපණ ක්‍රම දෙකකි.

(iv) කරදිය මුදා නාට්‍යයේ මන්නාඩි රාළ සහ මකුළුවාගේ චරිත රංගනය කරන ලද්දේ ........................ මහතා විසිනි.

(v) වෙස් නර්තනයෙහි තාණ්ඩව ලක්ෂණ පවතින අතර ගිරිදේවි නර්තනයෙහි ................................ ලක්ෂණ දැකිය හැකි ය.

(vi) රේඛා, හැඩතල සහ සමබරතාව යන මූලධර්ම, නර්තන කලාවට මෙන් ම ........................................ කලාවට ද වැදගත් වේ.

(vii) අස්නේ සහ යක් ඇනුම යන ශාස්ත්‍රීය නර්තන අංග ................................ නර්තන සම්ප්‍රදායට අයත් වේ.

(viii) කථකලි නර්තනයේ ප්‍රධාන ගායකයා පොන්නානි වන අතර අනු ගායකයා ........................ නමින් හැඳින්වේ.

(ix) සබරගමු නර්තන සම්ප්‍රදායේ 'කලාසම' යන්නට **සමාන** වන උඩරට සහ පහතරට නර්තන කොටස නම් කරන්න.
 (අ) උඩරට - ........................................
 (ආ) පහතරට - ........................................

(x) සාම්ප්‍රදායික හේවිසි වාදනයේ දී ප්‍රධාන වශයෙන් භාවිත කෙරෙන විතත භාණ්ඩය සහ සුසිර භාණ්ඩය කුමක්ද?
 (අ) විතත භාණ්ඩය - ........................................
 (ආ) සුසිර භාණ්ඩය - ........................................

WWW.OLEVELAPI.COM

**2.** (i) මාත්‍රා (2 + 3) සුළු මැදුම් දෙතිතට අයත් බෙර පදයක් ප්‍රස්තාරගත කරන්න.
(ii) මාත්‍රා (3 + 3) තනි තිතට අයත් රබන් පදයක් ප්‍රස්තාරගත කරන්න.
(iii) මාත්‍රා (2 + 4) සුළු මහ දෙතිතට අයත් වන්නමක හෝ සින්දු වන්නමක අඩච්ච/ඉරට්ටිය ප්‍රස්තාරගත කරන්න.

**3.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.
(i) නව නළු රස
(ii) තුන්තිතේ ප්‍රභේද
(iii) සතර බීජාක්ෂර
(iv) අංග රචනය
(v) රාස්ලීලා

/හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**4.** දේශීය ශාන්තිකර්මවල සම්ප්‍රදාය වශයෙන් පුද පූජා වෙන් වෙන් ව ඉටු කළ ද, ආකෘතියෙහි සමානතා පවතී.

(i) කොහොඹා කංකාරියේ පුද ලබන දෙවිවරු **දෙදෙනෙක්** හා චාරිත්‍ර විධි **දෙකක්** නම් කරන්න.

(ii) දෙවොල් මඩුව හෝ පහන් මඩුව හෝ ශාන්තිකර්මයේ එන නර්තනාංග **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න.

(iii) කොහොඹා කංකාරිය හෝ පහන් මඩු හෝ දෙවොල් මඩු හෝ ශාන්තිකර්මයේ එන සැරසිලි විස්තර කරන්න.

**5.** (i) සොකරි හා කෝලම් නාටකවල එන චරිත **දෙක** බැගින් නම් කරන්න.

(ii) කෝලම් නාටකය පැවැත්වීමේ අතීත හා වර්තමාන අරමුණු සැකෙවින් විස්තර කරන්න.

(iii) සොකරි නාටකයේ රංග භාණ්ඩ හා වස්ත්‍රාභරණ පිළිබඳ විග්‍රහ කරන්න.

**6.** පහත රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



**A**



**C**



**E**



**B**



**D**

(i) **A** හෝ **B** හෝ රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ii) **D** හෝ **E** හෝ රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායේ අංග රචනය හා වස්ත්‍රාභරණ පිළිබඳ විග්‍රහ කරන්න.

(iii) **C** රූපයෙන් දැක්වෙන රංග කලාවේ ආරම්භය හා විකාශනය පිළිබඳ විමසීමක් කරන්න.

**7.** (i) "අද්‍යතන නර්තන නිර්මාණකරණය" නර්තන කලාවේ ප්‍රගමනයට හේතු වී ඇති අයුරු විස්තර කරන්න.

(ii) ප්‍රාසංගික නර්තනය සඳහා තාක්ෂණික උපක්‍රම භාවිතයේ නව ප්‍රවණතා විස්තර කරන්න.

(iii) ශ්‍රී ලාංකේය නර්තන කලාවේ වෘත්තීය ශිල්පීන් බිහිවීම පිළිබඳ ඔබේ අදහස් විමසුමට ලක් කරන්න.

WWW.OLEVELAPI.COM

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...